FACULTY OF GRADUATE STUDIES
RECEIVED
01 JUL 2013
UNIVERSITY OF KELANIYA

# දඹදෙණි යුගයේ දේශපාලන, ආර්ථික සමාජ හා ආගමික තත්ත්වය

## (ප්‍රාථමික මුලාශ්‍ර ඇසුරෙන් කෙරෙන විමර්ශනයක්)

ප්‍රවේශ අංකය: 816
වර්ග අංකය:

**MSSc**

**FGS/HIST/MC/09/004**

**2012**

# සාරාංශය

දඹදෙණි යුගයේ දේශපාලන, ආර්ථික, සමාජ හා ආගමික තත්ත්වයන් පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි. අරමුණු පිළිබඳව හැඳින්වීමත්, මේ පර්යේෂණයට ඉවහල් කරගත්තා වූ සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර කවරේ ද යන්න පිළිබඳවත් පළමුවන පරිච්ඡේදය මඟින් සාකච්ඡා කර ඇත. කාලිංග මාඝගේ ආක්‍රමණය හේතු කොට ගෙන පෙර නොවූ විරූ අන්දමින් සමාජ ව්‍යුහයම බිඳ වැටුණ අතර එය රාජධානිය නිරිතදිගට සංක්‍රමණය වීමට බලපෑ ආසන්නතම සාධකය වූ බව පෙනේ. දේශපාලන, ආර්ථික, සමාජ හා ආගමික වශයෙන් බිඳ වැටුණ සමස්ත ව්‍යුහයම යළි ප්‍රකෘතිමත් කොට එක්සේසත් කළේ දඹදෙණි රජපෙළපතේ පාලකයන් විසිනි. මෙම විමර්ශනයේ දී උපයෝගී වූ මූලාශ්‍රය බොහොමයක් "සාහිත්‍යමය මූලාශ්‍ර" වන අතර "පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර" ද ඒ අතර වේ. සාහිත්‍යමය මූලාශ්‍ර අතර ප්‍රාථමික හා ද්විතික මූලාශ්‍ර විය. පොළොන්නරු යුගයේ ආරම්භයේ සිට මාඝ ආක්‍රමණය දක්වාත්, මාඝ ආක්‍රමණය හා එයින් පසු ඇති වූ දේශපාලන තත්ත්වය දෙවන පරිච්ඡේදයෙන් විග්‍රහ කොට දක්වා තිබේ. අනුරාධපුරය අගනුවර ලෙස පැවති කාලයේ අවසානයේ දී උතුරු ලංකාවේ ස්වකීය ආධිපත්‍යය පැතිර වූ චෝළයෝ සමකාලීනව දක්ෂිණ භාරතයේ බලවත්ම රාජධානියට හිමිකරුවන්ව සිටියහ. ක්‍රි:ව: දහවන සියවසේ දී රජරට ආක්‍රමණය කළ චෝළයෝ අනුරාධපුර රාජධානියේ අවසාන සිංහල රජු වූ v මිහිඳු රජතුමා ක්‍රි.ව.1017 දී සිරකරුවෙකු ලෙස ඉන්දියාවට ගෙන ගිය පසු චෝළ අධිරාජ්‍යයා උතුරු ලංකාවේ පාලකයා බවට පත්විය. චෝළයෝ උතුරු ලංකාවේ ස්වකීය පාලන කාලය තුළ දී අනුරාධපුරයේ සිට "ජනනාථපුරම්" යනුවෙන් ඔවුන් විසින් නම් කරන ලද පොළොන්නරුවට අගනුවර මාරු කළහ. අඩසියවසකට වැඩි කාලයක් (ක්‍රි.ව.1017-1070) රජරට ආධිපත්‍ය පිහිටුවාගෙන සිටි චෝළයින්ගෙන් රට මුදාගත් පළමුවන විජයබාහු නම් රජතුමා (ක්‍රි.ව.1070 - 1110) පොළොන්නරුවේ ප්‍රථම පාලකයා විය. මොහුගෙන් පසු පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ (ක්‍රි.ව.1153 - 1186) රාජ්‍ය කාලය දේශපාලන, ආර්ථික, ආගමික හා සමාජීය වශයෙන් ස්වර්ණමය යුගයක් වූ බව මහාවංසයේ 64 සිට 79 දක්වා වූ පරිච්ඡේද අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. පරාක්‍රමබාහු රජතුමාගේ අභාවයත් සමඟම කාලිංග පරම්පරාවට අයත් නිශ්ශංකමල්ල රජතුමා (ක්‍රි.ව.1187-1196) බලයට පත්වේ. මෙම ශ්‍රේෂ්ඨ රජවරු යටතේ බලවත්ව පැවති පොළොන්නරු රාජධානිය පසුකාලීනව බලයට පත්වන දුර්වල පාලකයන් හමුවේ හා සෙන්පතිවරුන්ගේ ක්‍රියාකලාපයන් හේතු කොට ගෙන පරිහානිය කරායමින් පැවැති බව පෙනේ. මෙබඳු වාතාවරණයක් තුළ ක්‍රි:ව: 1215 දී "කාලිංග මාඝ" ඇතුළු කේරළ භට හමුදාව දිවයින ආක්‍රමණය කිරීම පොළොන්නරු රාජධානිය බිඳ වැටීමේ උච්චතම අවස්ථාව විය. පෙර නොවූ විරූ අන්දමින් රජරටට

පහර දී කොල්ල කෑ බැවින් ජනතාව සෑම අතකින්ම පීඩාවට පත් වූ අතර එය රාජධානිය නිරිත දිගට සංක්‍රමණය වීමට හේතු පාදක විය. මේ හේතු කොට ගෙන දේශපාලන, ආර්ථික, ආගමික හා සමාජීය ව්‍යුහයම දෙදරා ගිය අතර එය "දඹදෙණිය" කේන්ද්‍රකොට ගනිමින් නව රාජධානියක් බිහි වීමට හේතු විය. තෙවන පරිච්ඡේදයෙන් දඹදෙණි යුගයේ දේශපාලන තත්ත්වය පිළිබඳ විග්‍රහ කොට තිබේ. දඹදෙණි රජවරුන්ගේ රාජ්‍ය පාලනය මෙරට දේශපාලන ඉතිහාසයෙහි තීරණාත්මක යුගයකි. දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ (ක්‍රි.ව.1236-1270) රාජ්‍ය කාලය දේශපාලන වශයෙන් වැදගත් වූයේ වසර හතළිහක් පැවති මාඝ ඇතුළු කේරළ හමුදා පලවා හැර රට එක්සේසත් කළ බැවිනි. එමෙන්ම ජාවක හමුදාවක් කැටුව ආ චන්ද්‍රභානු නම් රජකු විසින් මෙහෙය වන ලද ආක්‍රමණයන්ට සාර්ථකව මුහුණ දීම ද වැදගත්ය. අග්නිදිග ආසියාතික රටක පාලකයකු විසින් ලංකාව ආක්‍රමණය කළ ප්‍රථම අවස්ථාව මෙයයි. දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ එකොළොස්වන රාජ්‍ය වර්ෂයේ දී (ක්‍රි.ව.1247) පළමු ආක්‍රමණය සිදුවිය. චන්ද්‍රභානු සහ ඔහුගේ ජාවක සේනාව පරාජය කරනු ලැබූ බව මහාවංසයේ හා පූජාවලියේ පැහැදිලිවම සඳහන් වේ. එමෙන්ම ක්‍රි.ව.1270 ට වසර කිහිපයකට පෙර දෙවන ජාවක ආක්‍රමණය සිදුවිය. මේ අවස්ථාව වන විට දෙවන පරාක්‍රමබාහු රජතුමා රෝගාතුරව සිටි බවට තොරතුරු වේ.

විසිදෙවන රාජ්‍ය වර්ෂයේ දී (ක්‍රි.ව.1258) අසාධ්‍ය රෝගයක් වැළඳුණු බව අලුත් නුවර දේවාලය කරවීම නම් ලේඛනයෙන් අනාවරණය වෙයි. පූජාවලියේ හා මහාවංසයේ එන තොරතුරු වලට අනුව පැහැදිලි වන්නේ, රාජ්‍ය පාලනය පිළිබඳ කාර්යභාරය හතරවන විජයබාහු කුමරුට පැවරීමෙන් අනතුරුව දෙවන ජාවක ආක්‍රමණය සිදු වූ බවයි. මෙම මූලාශ්‍රගත තොරතුරු වලට අනුව, විජයබාහු හා වීරබාහු යන කුමාරවරු මෙහි දී අභීතව පෙරමුණ ගෙන චන්ද්‍රභානු රජු පලවා හැරීම දේශපාලනික වශයෙන් කැපී පෙනේ.

එමෙන්ම දෙවන පරාක්‍රමබාහු රජු දවස පාණ්ඩ්‍ය රජවරුන් විසින් ලංකාවට එල්ල කරන ලද ආක්‍රමණය පිළිබඳව ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍ය හා ජටාවර්මන් වීර පාණ්ඩ්‍ය යන රජවරුන්ගේ රාජ්‍ය කාලවලට අයත් වන සෙල්ලිපි කිහිපයකින් අනාවරණය වේ. මේ පාණ්ඩ්‍ය බලපෑම් වලට සාර්ථකව මුහුණ දුන් දෙවන පරාක්‍රමබාහු රජතුමා දේශපාලන එක්සත්භාවය ඇති කරලීමට දූරදර්ශීව ක්‍රියාකිරීම දක්නට ලැබේ.

දෙවන පරාක්‍රමබාහු රජතුමාගෙන් පසු ඔහුගේ වැඩිමහල් පුත්‍ර හතරවන විජයබාහු (ක්‍රි.ව.1270-1272) හෙවත් බෝසත් විජයබාහු දඹදෙණියේ රජ වූ අතර ඔහුගේ දූරදර්ශී දේශපාලන නායකත්වය ද දඹදෙණි දේශපාලන ඉතිහාසයේ කැපී පෙනේ. එමෙන්ම දඹදෙණි යුගයේ ආර්ථික තත්ත්වය සිව්වන පරිච්ඡේදයෙන් ගෙන

හැර දක්වයි. දහතුන් වන සියවසේ දී රජරට සිදු වූ දේශපාලන, ආර්ථික, සමාජ ව්‍යාකූලතා හේතු කොට ගෙන මායා රටට සංක්‍රමණය වූ ජනතාව නව පාරිසරික තත්ත්වයකට මුහුණ දීමට සිදු වූ අතර ඒ ඔස්සේ ආර්ථිකය සංවිධානය කර ගන්නට විය. දඹදෙණි යුගයේ මහජනයාගේත් ප්‍රධාන ජීවන ක්‍රමය වූයේ ගොවිතැන ය. පොල්, කපු, දෙල්, කොස්, පුවක් ආදී වැවිලි ද මේ අවධියේ දියුණුව පැවතිණ. කෘෂිකර්මය කේන්ද්‍ර කොට ගත් අර්ථරටාව, ඒ හා බැඳි ශ්‍රමදායකත්වය, ඒ තුළින් ගොඩනැගුණු වෙළඳ රටාව වැදගත් වේ. වෙළඳාම අගනුවරවල කටයුතුවලින් එකක් වූ අතර වරාය නගරවල ප්‍රධාන කටයුත්ත වූයේ එයයි. ආනයන හා අපනයන මධ්‍යස්ථාන ලෙස වරාය, නගර, භාණ්ඩ එකතු කිරීමේ හා බෙදාහැරීමේ මධ්‍යස්ථාන ද විය. අපනයන ද්‍රව්‍ය වූ මුතු, මැණික්, කුළුබඩු හා ඇතුන් වැනි සතුන් පවා රට අභ්‍යන්තරයේ එකතු කොට වරාය නගරවලට ප්‍රවාහනය කරන ලදී. පිඟන් භාණ්ඩ, සේද, සුවඳ විලවුන් වැනි ආනයනය කළ සුඛෝපභෝගී භාණ්ඩ දේශීය වෙළඳ පොළට යොමු වූ වෙළඳ රටාවක් විය. පළතුරු, පළා වර්ග, මී පැණි, ගිතෙල්, රෙදිපිළි, බුලත්, පුවක් වැනි වෙළඳ ද්‍රව්‍ය ද අභ්‍යන්තර වෙළඳාමේ ප්‍රධාන වූ බව පෙනේ.

මේ අවධියේ පැවති සමාජ තත්ත්වයේ ස්වභාවය පස්වන පරිච්ඡේදයෙන් විග්‍රහ වේ. පොළොන්නරු රාජධානිය කාලිංග මාඝ රජුගේ ග්‍රහණයට නතු වීමත් සමඟ කුල සම්ප්‍රදායන්ට හානි සිදු වූ බව පෙනෙන අතර රාජධානිය නිරිත දිගට සංක්‍රමණය වීමත් සමඟ ක්‍රමානුකූලව නැවත සමාජ ව්‍යුහය සැකසෙන්නට පසුබිම නිර්මාණය වූ බව පැහැදිලි කර ගත හැකිය. විශේෂයෙන් විවිධ රැකියා මත පදනම් වූ සමාජ ක්‍රමයක් මෙකල දක්නට ලැබෙන අතර යුද්ධ කාර්ය, නගර නිර්මාණය, ගමනාගමන පහසුකම් සැලැස්වීම් ආදිය සඳහා විවිධ කාර්මිකයන් සිටින්නට ඇත. විජයබාහු යුවරජ පොළොන්නරුව ප්‍රතිසංස්කරණයට යාමේදී දඹදෙණියෙන් ගෙනගිය කාර්මිකයන් අතර යකඩ වැඩකරු, ලියන වඩු, කුඹල්කරු, රන්කරු, සිත්තරු, උළුවඩු, ලී වඩු, ගල්වඩු ආදීන් වූ බව සඳහන් වීමෙන් ඒ බැව් පැහැදිලි වේ.

ආගමික තත්ත්වය හයවන පරිච්ඡේදයෙන් විස්තර කොට දක්වා තිබේ. කාලිංග මාඝගේ දැඩි කෲර ප්‍රතිපත්තීන් ආගමික අංශය පරිහානියට පත්වීමට හේතු වූ බව පෙනේ. දඹදෙණි රජවරු බිඳීගිය ආගමික අංශය නැවත ප්‍රකෘතිමත් කිරීමට ගත් උත්සාහය ප්‍රාථමික මූලාශ්‍ර තුළින් පැහැදිලි කර ගත හැකිය. අවසාන පරිච්ඡේදය වන හත්වැන්නෙහි සමාලෝචනය ගෙන හැර දක්වයි.

සමස්තයක් වශයෙන් ගත් කළ ඒ ඒ අංශයන්ට අදාළ පරිච්ඡේදයන් විමසා බැලීමෙන් දඹදෙණි රාජධානි සමයේ දේශපාලන, ආර්ථික, සමාජ හා ආගමික රටාවේ ස්වරූපය කවරාකාර වූයේ ද යන්න පිළිබඳව පැහැදිලි කරගත හැකිය.